# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120
ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1533/ 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023 திகதி
දිනය / Date – 07/12/2023 පැය 0615

## මාධ්‍ය නිවේදනය

### මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ සොරකමට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම - මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ කාමරයේ තිබූ නඩු භාණ්ඩ අස්ථානගතවීමක් සම්බන්ධයෙන් අධිකරණ රෙජිස්ටාර්වරයා විසින් 2023.07.12 වන දින මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වෙත සිදුකරන ලද පැමිණිල්ලක් අනුව විමර්ශනයක් සිදු කරමින් පවතී.

මෙම සොරකම සම්බන්ධයෙන් 2023.11.26 සහ 28 වන දිනවල දී මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ බහු කාර්ය සංවර්ධන නිලධාරීන් ලෙස සේවය කරනු ලැබූ පුද්ගලයින් දෙදෙනෙකු සහ 2023.12.02 වන දින තවත් පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන තිබූ අතර එදිනම මෙම අවි සොරකමට ආධාර අනුබල දීම හා මිලට ගැනිම සම්බන්ධව තවත් සැකකරුවන් දෙදෙනෙකු ද මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබුණි. මෙම සැකකරුවන් විසින් ටි 56 වර්ගයේ ගිනි අවියක් හා රිවෝල්වර් අවියක් සොරකම් කර මුදලට විකුණා තිබූ අතර එම අවි දෙක විමර්ශන නිලධාරින් විසින් සොයා ගන්නා ලදි.

රැඳවුම් නියෝග මත රඳවාගෙන ප්‍රශ්න කිරීමේදී 2023.12.02 වන දින අත්අඩංගුවට ගත් තෙවන සැකකරු මාතර ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ කාමරයේ තිබී සොරකම් කර අලෙවි කරන ලද තවත් ගිනි අවි දෙකක් සම්බන්ධව තොරතුරු අනාවරණ වී ඇත. ඒ අනුව 2023.12.04 වන දින හා 2023.12.06 වන දිනවල ඊට ආධාර අනුබල දුන් තවත් සැකකරුවන් දෙදෙනෙකු ද , 2023.12.06 වන දිනම එම අවි දෙක රුපියල් 220,000/= ක මුදලකට මිලටගත් තවත් සැකකරුවෙකු ද අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු සන්තකයේ තිබී රිවෝල්වර් වර්ගයේ අවියක් හා මෙරට නිශ්පාදිත මි.මි. 9 වර්ගයේ පතරොම් යෙදිය හැකි රිවෝල්වර් අවියකට සමාන අවියක් විමර්ශන නිලධාරින් විසින් සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරුවන් වයස අවුරුදු 27,30 හා 31 ක් වන නාඳුගල සහ වෙහෙරහේන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මේ වන විට මාතර ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් සොරාගන්නා ලද ටි 56 වර්ගයේ ගිනි අවියක්, රිවෝල්වර් අවි දෙකක් හා මෙරට නිශ්පාදිත මි.මි. 9 වර්ගයේ පතරොම් යෙදිය හැකි රිවෝල්වර් අවියකට සමාන අවියක් විමර්ශන නිලධාරින් විසින් සොයා ගෙන ඇති අතර , අපරාධයට සම්බන්ධ 01,02 හා 03 යන සැකකරුවන් වන මාතර ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ බහු කාර්ය සංවර්ධන නිලධාරීන් තිදෙනා රඳවා තබාගෙන මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**